කොවිඩ්-19 ආසාදිත රෝගියෙකු මියගිය අවස්ථාවේදී විශේෂයෙන්ම ආදාහනය සිදු කරන දර්ශන පෙන්වීමේදී අදාළ දේහය ආදාහනාගාරයට රැගෙන යන අයුරු පෙන්වීම මගින් සහ ආදාහනය කිරීමට සූදානම් වන අවස්ථාවේදී එම මෘත ශරීරය බහාලූ පෙට්ටිය ආදාහනාගාරයට ඇතුලත් කර යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ පිරිස් ඇඳ සිටි ආරක්ෂිත කබා සහ අත්වැසුම් ආදිය ඉවත්කර ඒ තුලට දමන දර්ශන මගින් මියගිය පුද්ගලයාට යම් අගෞරවයක් සිදුවන බැවින්, එම තත්වය මග හරවා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය නම් දේහය සුසාන භූමිය වෙත රැගෙන එන දර්ශන පමණක් විකාශය කරන ලෙස ඉල්ලීමක් කොවිඩ්-19 සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී පිළිපැදීම සඳහා මාධ්‍ය වෙත රජය මගින් හඳුන්වා දුන් නිර්දේශ මාලාවේ සඳහන් වේ.

ඉහත දැක්වෙන නිර්දේශයේ අරමුණ වන්නේ කොවිඩ්-19 ඔස්සේ මියයන අයෙකුට සිදුවන යම් අගෞරවයක් වැළැක්වීම සහ ඒ ඔස්සේ මියගිය අයගේ සමීපතමයන්ට ඇතිවිය හැකි සිත් වේදනාවක් වැළැක්වීමයි. කෙසේ වෙතත් "මන්නාරම් දිස්ත්‍රික්කයෙන් පළමු කොරෝනා මරණය වාර්තා වෙයි" යන සිරස්තලයෙන් යුතුව මව්බිම පුවත්පතේ (01/21) දක්වා ඇති පුවත් වාර්තාව සමගින් වන සේයාරුවෙහි දැක්වෙන්නේ දේහය ආදාහනාගාරයට රැගෙන යන අයුරයි. එසේ නම් මව්බිම මෙහිදී උක්ත දැක්වූ නිර්දේශය කඩ කොට තිබේ. මෙය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේදැයි අප විමසිය යුතුයි.

මූලාශ්‍ර:
https://mcusercontent.com/e5e1192127653987d107e6f98/images/76820bda-4513-4f3d-9d49-0f0637e78d5d.jpg?fbclid=IwAR3aWlTMw1jy0j5Sjlln-_roOUghsog6CR5cexjtqOMd-18JQKokZZFAfJQ

මීට පෙර අප විසින් නිරීක්ෂණය කළ මීට සමාන ආචාර ධර්ම උල්ලංඝනයක් වෙත ප්‍රවේශය මෙතැනින්: https://www.facebook.com/ethicseye/photos/1319144615107259

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima